# ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පී.එල්.සී. හි සියලුම කොටස් හිමියන් වෙත කරනු ලබන දැනුම් දීමයි

2022 ජුනි 30 වැනි දින පෙ.ව. 10.00ට ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට නියමිත සමාගමේ

## 17 වැනි වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳව කරනු ලබන දැනුම් දීමයි.

---

වර්තමානයේ රට තුළ උද්ගතව ඇති ආර්ථික අර්බුදය නිසා මුද්‍රණ කඩදාසි හිඟ වීම සහ මුද්‍රණ වියදම් අධික වීම හේතුවෙන් මෙම වසරේ වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපතක් ඉල්ලා සිටින කොටස් හිමියන් වෙත එය ලබා දීමට නොහැකි වී ඇති බව කණගාටුවෙන් දන්වා සිටිමු.

ඒ අනුව, කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් 2022 මැයි 27 දින නිකුත් කරන ලද අංක 04/2022 චක්‍රලේඛයට අනුව, 2021/22 වසර සඳහා මුද්‍රිත වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් නොකෙරෙන බව සිය කොටස් හිමියන් වෙත දැනුම් දීම සඳහා සමාගම මෙම මහජන නිවේදනය ප්‍රකාශයට පත් කරයි.

කෙසේ වෙතත්, සියලුම කොටස් හිමියන් හට එක හා සමානව මෙන්ම කිසිදු අගතියකින් තොරව සමාගමේ වාර්ෂික වාර්තාවට ප්‍රවේශ වීමට සහ වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම සහ තහවුරු කිරීම සඳහා අපි රැස්වීම පිළිබඳ දැන්වීම (පහත දක්වා ඇත) සහ අදාළ ලියකියවිලි, ඇතුළුව ''ඔන්ලයින්'' තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන වාර්ෂික මහා සභා රැස්වීම සඳහා මාර්ගෝපදේශ හා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය. සහ රැස්වීමට සහභාගී වන කොටස් හිමියන්ගේ විස්තර ලියාපදිංචි කිරීම - (2022). (ලියාපදිංචි කිරීමේ පෝරමය) CSE වෙබ් අඩවියට (https://www.cse.lk/home/company-info/PLR.N0000/financial) සහ අපගේ ආයතනික වෙබ් අඩවියට (https://www.primeresidencies.lk/investor-relations) ඇතුළත් කර ඇත.

### වාර්ෂික මහා සභා රැස්වීව පිළිබඳව දැනුම්දීම

පහත සඳහන් කරුනු වෙනුවෙන් ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පීඑල්සී හි කොටස් හිමියන්ගේ 17 වැනි වාර්ෂික මහා සභා රැස්වීම 2022 ජුනි මස 30 වැනි දින පෙ.ව. 10.00 ට ඔන්ලයින් තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. රැස්වීම පිළිබඳ දැනුම්දීම.
2. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ගිණුම් ප්‍රකාශයන් විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම සහ සලකා බැලීම.
3. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවේ වගන්තීන් ගේ 29 (1) (ඉ) වගන්තිය අනුව එන්.එල්.එස්. ජෝශප් මහතා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කර ගැනීම.
4. ආයතනය පාලනය සංග්‍රහයේ ක්‍රියාමාර්ගයන් සහ සුදුසුකම් අනුව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් විශ්‍රාම යන එස්.එම්.එස්.එස්.බණ්ඩාර මහතා නැවත තෝරා පත්කර ගැනීම.
5. ආයතනය පාලනය සංග්‍රහයේ ක්‍රියාමාර්ගයන් සහ සුදුසුකම් අනුව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් විශ්‍රාම යන ඩී.සූරියආරච්චි මහතා නැවත තෝරා පත්කර ගැනීම.
6. BDO Partners හවුල්කරුවන්, වරලත් ගණකාධිකාරීවරුන් ඊළඟ වසර සඳහා සමාගමේ විගණකවරුන් ලෙස නැවත පත් කිරීම සහ ඔවුන්ගේ වේතනය තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම.
7. 2022/23 වසර සඳහා පුණ්‍ය කටයුතු සහ අනෙකුත් පරිත්‍යාග සඳහා දායක මුදල් තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරීම

ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පීඑල්සී
අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව

Pele Consulting (Private) Limited
(අත්සන් කරනලදී)
සමාගම් ලේකම්වරු
දිනය: 2022 ජුනි 6

PRIME RESIDENCIES